# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2016.01.26

වේලාව : ප.ව. 02.30

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

**සහභාගී වූ නිළධාරීන්ගේ නාම ලේඛනය :**

| | | | |
|---|---|---|---|
| **1)** | **ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මිය** | **-** | **ප්‍රධාන ලේකම් ( බ.ප).** |
| **2)** | **පී. සෝමසිරි මයා.** | **-** | **ආණ්ඩුකාර ලේකම්(බ/ප).** |
| **3)** | **වී. රාජපක්ෂ මිය** | **-** | **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප).** |
| **4)** | **එච්.ඩී.කේ. සමරකෝන් මයා** | **-** | **සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප).** |
| **5)** | **එම්.ඒ.බී.ඩී.සෙනරත් මයා** | **-** | **ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප).** |
| **6)** | **එස්.ජී. විජයබන්දු මයා** | **-** | **ලේකම්, අධ්‍යාපන, සංස්කෘතික අමාත්‍යාංශය (බ.ප).** |
| **7)** | **ටී.වී.ඩී.ඩී.එස්.කරුණාරත්න මෙය** | **-** | **ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප).** |
| **8)** | **ප්‍රදීප් රත්නායක මයා** | **-** | **ප්‍රවාහන අමාත්‍යාංශය(බ/ප).** |
| **9)** | **එන්. නිල්වල මයා.** | **-** | **ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ/ප).** |
| **10)** | **කේ.කේ. චම්පිකා කනේරු මිය.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).** |
| **11)** | **බන්දුල ප්‍රේමකුමාර මයා** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය).** |
| **12)** | **ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).** |
| **13)** | **සේනක සිල්වා මයා** | **-** | **අධ්‍යක්ෂ(සැලසුම්).** |
| **14)** | **කේ.එන්. සූරියආරච්චි මිය.** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන).** |
| **15)** | **එස්.ජේ. ජයසිංහ මිය** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු).** |

ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එකම භූමියක ස්ථාපිත කිරීම. | ධූරධාරීන්ගේ කාර්යාල කාමර වල යාබද නාන කාමර නොමැති වීම පිළිබඳව කාරක සභාවේ රැස්වීමේදී සාකච්ඡා වූ බව පවසන ලදී.මේ පිළිබඳව නැවත පරීක්ෂා කිරීමටත් සභාව ඇතුලත් වන තට්ටුවේ අභ්‍යන්තර සැකසුම් පිළිබඳව අවධානය යොමු කරන ලෙස ද උපදෙස් ලබා දුනි. වාහන නැවැත්වීම සඳහා යාබද බස් නැවතුම්පල භූමිය ලබා ගැනීම පිළිබඳව ද සාකච්ඡා විය.බස් නැවතුම සඳහා ඉඩමක් ලබා දීම පිළිබඳව අවධානය යොමු කරන ලෙස දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ලේකම්,ප්‍රවාහන අමාත්‍යාංශය |
| 02. | තාක්ෂණ සේවයේ නිලධාරීන් බඳවා ගැනීම | දැනට පුරප්පාඩු 130ක් පමණ තිබෙන බවත් පෙබරවාරි මාසයේදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම් පත් කැඳවන බවත් සහකාර ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) විසින් පවසන ලදී.<br>මෙම පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමේදී සඳහන් කරන්නේ විශ්‍රාම වැටුප් සහිතවද නැත්නම් දායක විශ්‍රාම වැටුප් සහිතව ද යන්න ගැටළුවක් වී ඇති බවද පවසන ලදී. 'රජය විසින් නියම කරනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමයකට යටත්ව' ලෙස සඳහන් කර අයදුම්පත් කැඳවන ලෙසට ප්‍රධාන ලේකම්තුමිය විසින් උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. |
| 03. | විමර්ශන නිලධාරීන් බඳවා ගැනීම | පළාත් පාලන අමාත්‍යාංශය සඳහා විමර්ශන නිලධාරීන් 34 දෙනෙකු බඳවා ගැනීමක් සිදු කල බවත් තවත් පුරප්පාඩු කිහිපයක් පවතින බවත් පවසන ලදී. එහිදීද 'රජය විසින් නියම කරනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමයකට යටත්ව' ලෙස සඳහන් කරන ලෙසට ප්‍රධාන ලේකම්තුමිය විසින් උපදෙස් දෙන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 04. | තොරතුරු තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂ තනතුර. | එම ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව ක්‍රියාකරන ලෙසට උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | | |
|---|---|---|---|
| **05.** | දීමනා ගෙවීම. | ව්‍යාපෘති ඉටු කිරීමේදී බාහිර පුද්ගලයින් සඳහා කරණු ලබන ගෙවීම් දීමනා කමිටුවට ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බවත් ව්‍යාපෘති ඇස්තමේන්තු අනුමත කිරීමේදී ඒ සම්බන්ධ වගකීම අමාත්‍යාංශ ලේකම් දැරිය යුතු බවත් එය සාධාරණීකරණය කිරීම කල හැකි විය යුතු බවත් පවසන ලදී. | සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් |
| **06.** | ජනාධිපති තුමාගේ දේශීය ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම. | තුන් අවුරුදු කෘෂිකාර්මික සැලසුමක් සකස් කරන ලෙසට හා පළාත් මෙහෙයුම් කමිටුව සමග රැස්වීම සඳහා කටයුතු සූදානම් කිරීමට පසුගිය රැස්වීමේදී දුන් උපදෙස් අනුව සති 02ක් තුල අදාල කටයුතු සිදු කරන ලෙසට උපදෙස් දෙන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය.<br><br>අධ්‍යක්ෂ (සැලසුම්). |
| **07.** | නව වාහන මිලදී ගැනීම. | දැනට තිබෙන වාහන හා අවශ්‍ය කරන වාහන පිළිබඳ වාර්තාවක් සති 02ක් තුල ලබා දෙන ලෙස සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දන්වන ලදී.<br>දැනට තිබෙන අවශ්‍යතා වලට අනුව අළුත් තොරතුරු අමාත්‍යාංශ වලින් ලබාගෙන අළුතින් වාර්තාවක් සකස්කර ඒ අනුව වාහන ඉල්ලුම් කරන ලෙසට උපදෙස් දෙන ලදී. | සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |
| **08.** | කාර්ය සාධන බලකා. | නිල නිවාස සඳහා ඉඩ පහසුකම් ඇති ස්ථානයක් තිඹිරිගස්යායේ පවතින බව ආණ්ඩුකාර ලේකම් විසින් පවසන ලදී.<br>ඒ අනුව, එම ඉඩම නිරවුල් කර ගැනීමට කටයුතු කරන ලෙසට ප්‍රධාන ලේකම්තුමිය විසින් උපදෙස් දෙන ලදී. මේ සඳහා ගරු ජනාධිපතිතුමාගේ එකඟතාවය ලබාගැනීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ආණ්ඩුකාරතුමන්ගෙන් ඉල්ලා සිටින ලෙසට ආණ්ඩුකාර ලේකම්තුමා වෙත උපදෙස් දෙන ලදී.<br>නිල නිවාස ඉදිකිරීමට වඩා සාදා නිම කල මහල් නිවාස වලින් නිවාස ඒකක(**Housing blocks**) ලබා ගැනීම සුදුසු බව සාකච්ඡා විය.ඒ පිළිබඳවද සොයා බැලීමට උපදෙස් දෙන ලදී. | ආණ්ඩුකාර ලේකම්(බ.ප.).<br><br>ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය |
| **09.** | ඉදිකිරීම් සම්බන්ධ කටයුතු. | පාසල් වල ඉදිකිරීම් කටයුතු වලදී පාසල් සංවර්ධන සමිති මගින් කොන්ත්‍රාත් ලබා ගෙන සිදුකලද ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳව සෑහීමට පත්විය නොහැකි බව ප්‍රකාශ විය.<br>ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු සම්බන්ධව පාසල් සංවර්ධන සමිති ක්‍රියාකාරීත්වය වරින් වර නියාමනය කරගත යුතු බවත්<br>පාසල් සංවර්ධන සමිති පිළිබඳව සෑහීමකට පත්විය නොහැකිනම් ඔවුන් වෙත කොන්ත්‍රාත් ලබා දීම සිදු නොකරන ලෙසට ප්‍රධාන ලේකම්තුමිය විසින් උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |

| | | | |
|---|---|---|---|
| | | තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීමත් සමග මේ සම්බන්ධව විමසීම් ඉදිරිපත් විය හැකි බැවින් විධිමත් හා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කල යුතුය.<br>සමහර අවස්ථාවල ඉදිකිරීම් සම්බන්ධව පැමිණිලි ලැබෙන බැවින් පරීක්ෂා කිරීමට අවශ්‍ය කණ්ඩායමක අවශ්‍යතාවය පිළිබඳව සාකච්ඡා විය.ඒ සඳහා අභ්‍යන්තර විගණන අංශයේ සහය ලබා ගැනීමට ද තීරණය විය. | |
| **10.** | බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතින් කැඳවනු ලබන වාර්තා ප්‍රමාද වීම සම්බන්ධව යොමු කර ඇති ලිපිය. | පිළිතුරු ලැබී නොමැති ලිපි සඳහා නැවත සිහි කැඳවීම් කරන ලෙසට උපදෙස් දෙන ලදී.<br>මීළඟ රැස්වීම් වාරයේ සිට වාර්තා කැඳවීම් සඳහා පිළිතුරු ලැබීමේ ප්‍රගතිය සාකච්ඡාවට ගන්නා බව දැනුම් දෙන ලදී. | සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |
| **11.** | ප්‍රගති සමාලෝචනය. | **2016** වසරේ ව්‍යාපෘති සඳහා සැලසුම් සකස් කිරීම ශුන්‍ය පාදක අයවැය ක්‍රමවේදය යටතේ සිදුවිය යුතුය. මෙහිදී විශාල ආකෘතිපත්‍ර සංඛ්‍යාවක් මුදල් කොමිෂන් සභාවට ඉදිරිපත් කලයුතු බැවින් ඒවා සම්පූර්ණ කිරීම පිළිබඳව පුහුණු වැඩසටහන් පැවැත්වීමටත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ සැලසුම් ඒකක ශක්තිමත්ව කටයුතු කල යුතු බවත් ප්‍රධාන ලේකම්තුමිය අවධාරණය කරන ලදී.<br>ප්‍රතිපාදන සඳහා මුදල් මුදා හරින්නේ කාර්යසාධනය අනුව ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත බැවින් ඒ බව අවධානයට ලක් කර පළමු කාර්තුව තුල සියළු සැලසුම් ගෙන්වා ගැනීම කල යුතු බවද **PSDG**(පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන) යටතේ ව්‍යාපෘති සඳහා සැලසුම් **2016.01.31** දිනට පෙරද පළාත් සංවර්ධන ප්‍රදාන(**PDG**) යටතේ සැලසුම් සඳහාද ශුන්‍ය පාදක අයවැය ක්‍රමය ආදේශ කර ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. එලෙසම කාර්‍යසාධන සම්බන්ධ අධීක්ෂණ ක්‍රමවේදයක් සකස් කර ගත යුතු බවද ප්‍රකාශ විය.<br>තවද ව්‍යාපෘති හා සැලසුම් සම්බන්ධව අමාත්‍යවරුන් දැනුවත් කිරීමට කටයුතු කල යුතු බවද අමාත්‍යාංශ ලේකම්වරු වැඩි වගකීමක් දැරිය යුතු බවද ප්‍රකාශ කරන ලදී. | සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| **12.** | අපද්‍රව්‍ය අධිකාරිය ඉවත්වීමේ කටයුතු. | අපද්‍රව්‍ය අධිකාරිය ඉවත්වීම සඳහා කැමැත්ත පල කර ඇති බව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් පවසන ලදී.බත්තරමුල්ල ගොඩනැගිල්ල ලබාගෙන තිබෙන්නේ එම ආයතන සඳහා බැවින් එම ස්ථානයට කඩිනමින් යන ලෙසට ප්‍රධාන ලේකම්තුමිය විසින් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.මෙහි මාසික කුලිය ගෙවීම සම්බන්ධවද සාකච්ඡා විය. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| **13.** | තොරතුරු තාක්ෂණ සංවර්ධන ආයතනයේ සේවය කරන පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් පිළිබඳ. | තොරතුරු තාක්ෂණ සංවර්ධන ආයතනයේ සේවය කරන පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණ සංවර්ධන ආයතනය නමින්ම අනුමත කාර්ය මණ්ඩලයක් ඇති බැවින් ඒ අනුව බඳවා ගැනීම් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය)<br>සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්.<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| **14.** | ගැසට් පත්‍රය මගින් විෂයන් වෙනස් වුවද ප්‍රඥප්ති මගින් අමාත්‍යාංශ ලේකම් වෙත නිසි බලය ලැබී නොමැති වීම. | ප්‍රඥප්ති සංශෝධන කමිටුවට ඉදිරිපත් කර තීරණ ගැනීමට යෝජනා විය. | සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්. |
| **15.** | සභා රැස්වීම පවත්වන අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන් විසින් රාජ්‍ය නිලධාරීන් අපහසුතාවයට ලක්කරමින් ප්‍රකාශ නිකුත් කිරීම. | අයවැය දිනයේදී හැර අනෙකුත් දිනයන්හිදී සභා රැස්වීම සඳහා නිලධාරීන් සහභාගී වීම අනිවාර්ය නොවන බව සාකච්ඡා විය.මෙම තත්ත්වය ආණ්ඩුකාරතුමාට දැන්වීමට තීරණය විය.<br>තවද මේ සම්බන්ධව පාර්ලිමේන්තු ලේකම්ගෙන් විමසා තොරතුරු ලබා දෙන ලෙසට සභා ලේකම් තුමා වෙත උපදෙස් දෙන ලදී. | ආණ්ඩුකාර ලේකම්.<br><br>සභා ලේකම්. |
| **16.** | ප්ලාස්ටික් හා පොලිතින් භාවිතය හේතුවෙන් සිදුවන පරිසර හානිය අවම කර ගැනීම, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක: 01/2015 පිළිබඳව සියළුම ආයතන දැනුවත් කරන ලෙසට උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |
| **17.** | **68** වන නිදහස් සමරු උළෙල **- 2016.** | සියලුම නිලධාරීන්ට යොමු කර දැනුවත් කරන ලෙසට උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |

| | | | |
|---|---|---|---|
| **18.** | වාහන තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම | අදාල සියළුම අංශ වලින් තොරතුරු ලබාගෙන වාහන තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම ක්‍රමවත්ව සිදු කරන ලෙසට උපදෙස් දෙන ලදී. ඒ සඳහා පරිගණක වැඩසටහන් සකස් කර ගන්නා ලෙසද උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |
| **19.** | වාහන අපහරණ චක්‍රලේඛය | අවුරුදු 10ට අඩු වාහන අපහරණයේදී ප්‍රධාන ලේකම් විසින් අනුමත කලයුතු අතර අවුරුදු 10ට වැඩිනම් ප්‍රමාණ ගණන් දීමේ නිලධාරියා හා ගණන් දීමේ නිලධාරියා වෙත අපහරණය පිළිබඳ තීරණ ගැනීමට බලය පවරා ඇති බැවින් ප්‍ර.ලේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් නොකළ යුතු බව තීරනය කරන ලදී. | සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්. |
| **20** | වාහන ඉල්ලීම. | අධ්‍යාපන අමාතයාංශයේ ඉල්ලා ඇති කුලී පදනමට වාහන ලබා ගැනීම නොකල යුතු බවත් අධ්‍යාපන අමාත්‍යතුමා භාරයේ ඇති සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාහනය වහාම ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් දැනුම් දෙන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br>ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය. |
| **21.** | සෞඛ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලයම වැඩබැලීම සඳහා පත්කිරීම. | වැඩ බැලීම වෙනුවෙන් නිශ්චිත දීමනාවක් හා නිශ්චිත ඉන්ධන ප්‍රමාණයක් (50%) ලබා දීම සම්බන්ධව ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගන්නා ලෙසට උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br>සහකාර ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| **22.** | පළාත් සභා සංවර්ධන සැලැස්ම කාර්යක්ෂමව හා කඩිනම්ව ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණ පහසුකම් යොදාගැනීම පුළුල් කිරීම. - සැලසුම් අංශය. | සැලසුම් අංශයද ප්‍රධාන SEVER එකටම සම්බන්ධ කර ඇති බව නි.ප්‍ර.ලේ(ඉංජිනේරු) විසින් පවසන ලදී.<br>තවද අධ්‍යක්ෂ තනතුරු හා ඉහල නිලධාරීන්ට I- PAD එකක් හා සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා TAB එකක් ලබා දීමට තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්). |
| **23.** | වෙබ් පිටුව භාෂා 03න් යාවත්කාලීන කිරීම. | තොරතුරු දැන ගැනීමේ පනත බලාත්මක වන විට බාහිර පුද්ගලයන්ට තොරතුරු ලබාගැනීමට පහසු වන ආකාරයට සකස් කල යුතු අතර,<br>අඩුපාඩු හඳුනාගෙන විධිමත්ව යාවත්කාලීන කල යුතු බවට උපදෙස් දෙන ලදී.<br>මේ සම්බන්ධව විවෘත සංවාදයක් ICTA සමගද පවත්වා අඩුපාඩු හඳුනාගෙන එය වැඩිදියුණු කිරීමටත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සතියේ හෝ සති අන්ත දිනයක් යොදාගෙන මේ සම්බන්ධව සාකච්ඡා කිරීමටත් තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |

| | | | |
|---|---|---|---|
| **24.** | වෙනත් | ප්‍රාදේශීය ලේකම්වරුන් කැඳවා ව්‍යාපෘති සැකසීම,ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අදහස්,යෝජනා පිළිබඳව රැස්වීමක් පැවැත්වීම සුදුසු බවට යෝජනා විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |